**දඹුල්ල ප්‍රාදේශීය සභාව.**

**-------------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**---------------------------**

1 මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 01 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 02 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්වාගණනය කළ මතය.

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට දඹුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූල ධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2017 පළාත් සභා මන්ත්‍රී ආධාර යටතේ කිඹිස්ස මහින්දාරාමයට ද්‍රව්‍ය ආධාර ලබා දීමට අදාළ ණයගැතියන් රු.49,040 ක් අඩුවෙන් දැක්වුණි.

(ආ) 2016 හා 2017 වර්ෂවල සිදු කළ ඉදිකිරීම් 05 කට අදාළ කළවැඩ වටිනාකම වූ රු.9,161,563 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ මිලට ගැනීම්වලින් ප්‍රාග්ධනිත නොකළ යුතු රු.86,882 ක් වටිනා අයිතම් 22 ක් යන්ත්‍ර හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඈ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් මෝටර් ග්‍රේඩරය සඳහා ලබාගත් ණය මුදලේ වාර්ෂික පොලී ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.176,411 කින් වැඩියෙන් දැක්වුණි.

(ඉ) 2017 වර්ෂයේ පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ නමුත් 2018 වර්ෂයේදී ගිවිසුම්ගතව තිබූ රු.3,561,718 ක වටිනාකමැති කර්මාන්ත 05 ක් ණයහිමියන් ලෙස දැක්වීම හේතුවෙන් ණයහිමි වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2017 වර්ෂයේදී මිලදී ගත් රු.215,800 ක් වටිනා කාර්යාල උපකරණ ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් කාර්යාලීය උපකරණ ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2017 වර්ෂයේ ජුනි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම ඇස්තමේන්තු කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.6,508,280 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.98,612,027 ක් වූ ගිණුම් විෂයන් 07 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් පැවති අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.50,229,971 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 10 ක එකතුව රු.32,761,396 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින රු.24,724,665 ක් වූ ශේෂයක් ඊට ඇතුළත්ව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව රු.32,785,278 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින ශේෂය රු.7,731,117 ක් විය.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.2,197,706 ක් වූ ගිණුම් විෂයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

1.3.5.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලටයොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178(2)අ | - | ටෙන්ඩර් කැඳවීමේ නිවේදනයක ඇතුළත් කළයුතු සියලු විස්තර රහිතව ප්‍රාදේශීය සභාව විසින් භාණ්ඩ මිලට ගැනීමේ ටෙන්ඩර් දැන්වීම් පළ කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| i. මු.රෙ 137 | 16,200 | වවුචර් අනුමත කිරීමකින් තොරව නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. |
| ii. මු.රෙ 343 | - | උපපත්‍රිකා පොත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| iii. | මු.රෙ 1646 | - | ත්‍රීරෝද රථයේ ධාවන සටහන් 2017 සැප්තැම්බර් 30 න් පසුව ලියා නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාව සතු වාහන 06 සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂා කිරීම සිදුකර නොතිබුණි. |
| (ඇ) | 1991 මාර්තු 26 දිනැති මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛ අංක 3/91 | - | ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් මාස 04 ක් පමණ ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කර නොතිබුණි. |

1.3.5.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

වැට් බදු ලෙස එකතු කරන ලද වර්ෂ 05 කට වැඩි කාලයක සිට පවතින රු.2,605,010 ක් දේශීය ආදායම් කොමසාරිස් වෙත යවා නොතිබුණි.

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,139,149 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,205,630 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළිවෙළින් රු.684,566 ක් හා රු.4,122,169 ක් වශයෙන් ඉතිරි කිරීමේ ගිණුම් දෙකක මුදල් ආයෝජනය කර තිබූ නමුත් මෙම මුදල් වැඩි පොලී ආදායමක් ලබාගත හැකි පරිදි ස්ථාවර තැන්පත්වල ආයෝජනය කිරීමට සලකා බලා නොතිබුණි.

(ආ) අංක 138-1-001-2-5396699 දරන මහජන බැංකු ගිණුම 2017 පෙබරවාරි 08 දින වසා ඇති නමුත් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සභාවේ ලේඛන අනුව රු.31,313 ක ශේෂයක් පැවතුණි.

(ඇ) අංක 138-1-001-2-6704 දරන මහජන බැංකු ගිණුම වසර ගණනාවක සිට අක්‍රීයව ඇති අතර සභාවේ ලේඛන අනුව වර්ෂය අවසන් දිනට රු.13,450 ක අයිරාවක් පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,500,000 | 2,677,500 | 2,550,500 | 127,000 | - | 1,301,500 | 704,056 | 597,443 |
| කුලී | 1,717,500 | 2,070,000 | 1,926,667 | 1,187,493 | 1,700,000 | 1,720,820 | 1,720,820 | 1,044,160 |
| බලපත්‍ර ගාස්තු | 14,000,000 | 15,814,792 | 14,892,765 | 922,027 | 11,150,000 | 14,210,548 | 14,078,960 | 155,538 |
| වෙනත් ආදායම් | 17,000,000 | 12,722,230 | 2,965,450 | 9,756,780 | 16,000,000 | 18,493,367 | 7,228,575 | 11,264,792 |
| | 35,217,500 | 33,284,522 | 22,335,382 | 11,993,300 | 28,850,000 | 35,726,235 | 23,732,411 | 13,061,933 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට ලැබිය යුතු බලපත්‍ර ගාස්තු ගිණුමේ ශේෂය පෙර වර්ෂයට සාපේක්ෂව රු.766,489 කින් ඉහළ ගොස් තිබුණි.

(ආ) ප්‍රචාරක දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද භෞතික පරීක්ෂාවට අනුව රු.130,500 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභා බල ප්‍රදේශය තුළ ලියාපදිංචි වී ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන හෝටල් සංඛ්‍යාව 48 ක් වුවත් හෝටල් 28 කින් පමණක් වාර්ෂික වෙළඳ බලපත්‍ර ගාස්තු (ආදායමෙන් සියයට 0.3) රු.13,109,098 ක් අය කර ගෙන තිබුණි. සංචාරක හෝටල්වලින් ගාස්තු අය කිරීමේදී විගණනය කළ මූල්‍ය වාර්තා පදනම් කරගෙන ගාස්තු අය කළ යුතු වුවත් හෝටල් 05 කින් පමණක් විගණන වාර්තා මත ගාස්තු අය කර තිබුණි.

(ඈ) වසර 05 කට වැඩි කාලයක සිට අයනොවන වෙනත් ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර තිබූ රු.1,153,547 ක ශේෂයක් හා වසර 04 කට වැඩි කාලයක සිට අයනොවන රථවාහන නැවතුම්පළ කුලී ගිණුමේ රු.1,044,160 ක ශේෂය අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙළක් යොදා නොතිබුණි.

### 2.3.3 බලපත්‍ර ගාස්තු

වසර ගණනාවක සිට පැවත එන ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තුව වූ රු.22,950 ක් ද ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තුව රු.102,112 ක් විය.

### 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.376,500 ක් විය.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවයේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා සඳහා පැනවිය යුතු අතුරු ව්‍යවස්ථා බොහෝමයක් පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

----------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

සභා බල ප්‍රදේශය තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොවන අතර 2017 වර්ෂය තුළ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය පමණක් එක්රැස් කිරීම සඳහා රොටවැව සතිපොළ යොදාගෙන ඒකකයක් ආරම්භ කර තිබුණි. නමුත් කසළ තේරීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවීම, කසළ වෙන්කර බැහැර කිරීම සඳහා පහසුකම් ප්‍රමාණවත් නොවීම, කසළ වෙන්කර එකතු කිරීමට වාහන පහසුකම් ප්‍රමාණවත් නොවීම, ඝණ අපද්‍රව්‍ය මිලට ගැනීමට ගැනුම්කරුවන් සොයාගැනීම දුෂ්කර වීම සහ කම්කරුවන් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම ඒකකයේ කටයුතු ක්‍රියාත්මක කිරීම දුෂ්කර වී තිබුණි.

(ඈ) පාරිසරික ගැටළු

-------------------

ප්‍රාදේශීය සභා සහ දඹුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ එකතු වන කසළ ප්‍රාදේශීය සභාවට අයත් දිගම්පතහ ප්‍රදේශයට බැහැර කරන අතර වන අලින් ඇතුළු අනෙකුත් සතුන් කුණු කසළ සමඟ පොලිතින් ආහාරයට ගැනීම නිසා ඔවුන්ගේ ජීවිත අවධානමකට ලක්ව තිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම නිසා දිගුකාලීන සැලසුම් සකස් කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1996-2003 වර්ෂවලදී ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයෙන් කුලී පදනමට ලබාගත් යන්ත්‍රෝපකරණ සඳහා ගෙවිය යුතු කුලී රු.292,069 ක් ගෙවීම පැහැර හැරීම මත පවරා තිබූ නඩුවේ තීන්දුවට අනුව එම මුදල ගෙවීමට සිදුව තිබූ අතර නීතිඥ ගාස්තු සහ වෙනත් වියදම් ලෙස රු.76,300 ක මුදලක් සභාව දරා තිබුණි. එහෙත් සභාව විසින් කරුණු ඉදිරිපත් නොකිරීම හා නඩුවට ඉදිරිපත් නොවීම හේතුවෙන් සභාවට සහනයක් ලබාගත හැකිව තිබූ අවස්ථාව මගහැරී තිබුණි.

(ආ) ජල සම්පාදන ව්‍යාපෘතියක් මගින් ඉදිකර සභාවට පවරාදී තිබූ නල ළිං සඳහා වාර්ෂික නඩත්තුව වෙනුවෙන් එක් නල ළිදකට රු.200 බැගින් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට රු.774,700 ක මුදලක් සභාවට අයවීමට තිබුණි. මෙම මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් යොදා නොතිබූ අතර මෙම හිඟය තුළ වසර 20 කට වඩා පැරණි ශේෂ පැවතුණි. මෙම නළ ළිං අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් බඳවාගෙන තිබූ සේවකයින් දෙදෙනෙකු සභාවේ සේවය කරන අතර ලේඛනගත තොරතුරුවලට අනුව සැලකිය යුතු තරම් අලුත්වැඩියා කටයුතු පැනනැගී නොතිබුණි. මෙම සේවකයින් යොදවාගෙන හිඟ ආදායම් අයකර ගැනීමේ හැකියාව තිබුණ ද ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවට අයත් ඉනාමළුව ක්‍රීඩාපිටිය ඉඩම තුළ අනවසර ඉදිකිරීම් කිහිපයක් කර තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
------------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට කාර්ය මණ්ඩලයේ තනතුරු 16 ක පුරප්පාඩු පැවතුණි.

(ආ) විවිධ හේතු නිසා සභා සේවකයන් 23 දෙනෙකුගෙන් අයවීමට ඇති එකතුව රු.334,844 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවයට බඳවාගෙන වසර 05 කට ආසන්න කාලයක් ගතවී ඇතත් නිලධාරීන් 03 දෙනෙකුගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
----------------------------------
කැබ්රථයක් රු.89,100 ක් වැය කර යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයෙන් අලුත්වැඩියා කර 2015 දෙසැම්බර් 04 දින රැගෙන එන අතරමගදී එන්ජිම ගිනිගෙන නැවත අලුත්වැඩියා කිරීම වෙනුවෙන් වූ රු.132,309 ක බිල්පතක් ඉදිරිපත් කර තිබූ අතර ඒ සඳහා ගෙවීම් කිරීම 2017 වර්ෂයේදී සිදුකර තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය
----------------------------

3.5.1 පවරා නොගත් වත්කම්
--------------------------
මෝටර් රථ හා කරත්ත යටතේ දක්වා තිබුණු රු.4,329,350 ක් වටිනාකමැති වාහන තුනක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්
-------------------------------------
කැබ් රථයක් වසර 10 කට වැඩි කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

3.5.3 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය
--------------------------------------
2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලට අනුව ඉන්වෙන්ට්‍රි අයිතම්වල රු.156,380 ක ඌනතාවයක් අනාවරණය වී තිබූ නමුත් එම අලාභය අයකර ගෙන නොතිබුණි.

3.5.4 වාහන උපයෝජනය
------------------------
කැබ් රථයක් දුම් පරීක්ෂණයෙන් අසමත්වීම මත 2015 වර්ෂයේ සිට ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

3.6 හඳුනාගත් අලාභ
-------------------
2015 අප්‍රේල් 13 දින කැබ් රථයක් අනතුරට ලක් වීම සම්බන්ධයෙන් වූ මු.රෙ.104 පරීක්ෂණ වාර්තාවට අනුව රු.7,987,612 ක් වූ අලාභය අය කර ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ද එම මුදල අය කර ගෙන නොතිබුණි.

3.7 ප්‍රසම්පාදනය
---------------

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම
------------------------
සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.7.2 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------
පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.500,000 ක ප්‍රතිපාදන මත ඉදිකර තිබූ කුඹුක්කන්දගේන සොහොන්පිටිය මාර්ගයේ පාලම ඉදිකිරීමේදී ඇස්තමේන්තුවට අනුව කොන්ක්‍රීට් තට්ටුවේ ඝනකම 100mm - 125mm අතර විය යුතුව තිබියදී 125mm ක් ලෙස සලකා රු.51,498 ක් බිල්කර තිබුණි. පාලමේ දෙපස අත්වැට දෙකෙළවර යකඩ පැස්සූ ස්ථාන නිසි පරිදි ශක්තිමත්ව සවිවී නොතිබූ නමුත් මෙම වැඩ විෂය සඳහා රු.46,000 ක් බිල්කර තිබුණි.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
-------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයන් හා උප විෂයන් 29 කට අදාළව සලසා දී තිබූ රු.3,029,000 ක එකතු වටිනාකමකින් යුතු ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයන් හා උප විෂයන් 61 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර 23% සිට 98% දක්වා වූ පරාසයක විචලනයක් පැවතීම හේතුවෙන් අයවැය ලේඛනය ප්‍රමාණවත් පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
-------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අභ්‍යන්තර විගණන ඒකකයට අනුයුක්ත නිලධාරියා විගණන නිරීක්ෂණ සභාවේ ලේකම් වෙත නිකුත් කර තිබූ නමුත් එම විගණන විමසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ජනරාල්ගේ 2009 ජූනි 09 දිනැති DMA/2009(I) අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර කළමනාකරණ හා විගණන කමිටුවේ සාකච්ඡාවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

4.3 නොවිසඳී ඇති නිරීක්ෂණය හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂය තුළ සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 ක් සඳහා පිලිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විගණන විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.6.196,448 ක් විය.

5 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | වත්කම් / දේපළ | ඉඩම්වල ආරක්ෂාව තහවුරු කරන වැඩපිළිවෙළ ප්‍රමාණවත් නොවීම. |
| (ආ) | තොග පාලනය | මිලට ගැනීම් හා නිකුත් කිරීම් විධිමත්ව සටහන් නොකිරීම. |
| (ඇ) | ණයගැති / ණයහිමි | විධිමත් ආකාරයට ණයගැතියන් / ණයහිමියන් හඳුනා නොගැනීම හා නිරවුල් කිරීම් විධිමත් නොවීම මත උපලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි වීම. |
| (ඈ) | සේවක කළමනාකරණය | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | වාහන | i. නිශ්කාර්ය වාහන උපයෝජනය කරගැනීමට හෝ අපහරණය කරගැනීමට කටයුතු නොකිරීම.<br>ii. වාහන පවරා ගැනීමට කටයුතු නොකිරීම. |